# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2302/20 - 2022 ඔක්තෝබර් මස 19 වැනි බදාදා - 2022.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 වූ අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා, වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 28 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

1A - G 37816 — 21 (2022/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I උපලේඛනය

**ගැසට් නිවේදන අංක 1409/8** - මහ මාතර නාගරික බල ප්‍රදේශයේ කොටසක් (මාතර, වැලිගම, වැලිපිටිය, මාලිම්බඩ, තිහගොඩ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් කොටසක්) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස 2005.09.07 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදී.

**ගැසට් නිවේදන අංක 1420/17** - මාතර දිස්ත්‍රික්කය තුළ දකුණු අධිවේගී මාර්ගය ඇතුළත් කලාපය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස 2005.11.23 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදී.

## II උපලේඛනය

**මහ මාතර නාගරික සංවර්ධන ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස පුළුල් කර ප්‍රකාශයට පත්කිරීම.**

*I වන තීරුව*

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වැලිපිටිය (කොටසක්) වැලිගම (කොටසක්), තිහගොඩ (කොටසක්), මාලිම්බඩ (කොටසක්), මාතර (කොටසක්), දෙවිනුවර (කොටසක්) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය

*II වන තීරුව*

*උතුර*

අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම හා යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඡේදනය වන ආරම්භක ලක්ෂ්‍යයේ සිට වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ගිනිකොණ දෙසට මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එකී මායිම ඔස්සේ උතුරු දෙසට මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එකී මායිම ඔස්සේ නැගෙනහිර හා ගිනිකොණ දෙසට තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම හා උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට එකී මායිම ඔස්සේ ඊසාන දෙසට තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක් ද එතැන් සිට එකී මායිම ඔස්සේ නැගෙනහිර දෙසට තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නැගෙනහිර මායිම හමුවන තෙක් ද, එතැන් සිට එකී මායිම ඔස්සේ දකුණු දෙසට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර හා උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එකී මායිම ඔස්සේ ගිණිකොන දෙසට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම දක්වා ද,

*නැගෙනහිර*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට මාතර - තංගල්ල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද එතැන් සිට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට වඩදිය රේඛාව දක්වා ද,

***II උපලේඛනය - (සම්බන්ධිතයි)***

*I වන තීරුව*

*II වන තීරුව*

*දකුණ*

අවසන් වරට සඳහන් කරන ලද වඩදිය රේඛාව ඔස්සේ බටහිර දෙසට 2005.09.07 දිනැති අංක 1409/8 දරන *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත්කරන ලද මහ මාතර නාගරික සංවර්ධන ප්‍රදේශයේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍ය දක්වා ද එතැන් සිට එකී *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශයේ නැගෙනහිර මායිම් ඔස්සේ උතුරු දෙසට තංගල්ල - මාතර ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද එතැන් සිට එකී මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරමින් උතුරු දෙසට එකී *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශයේ උතුරු මායිම හමුවන තෙක් ද එතැන් සිට එකී උතුරු මායිම ඔස්සේ බටහිර දෙසට 2005.11.23 දිනැති අංක 1420/17 දරන *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශයේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍ය දක්වා ද, එතැන් සිට 2005.09.07 දිනැති අංක 1709/8 දරන *ගැසට්* නිවේදනය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශයේ බස්නාහිර මායිම ඔස්සේ නිරිත, බස්නාහිර හා ගිනිකොණ දෙසට පැරණි ගාල්ල මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍ය දක්වා ද එතැන් සිට එකී මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍ය ඔස්සේ නිරිත දෙසට ගාල්ල - මාතර ප්‍රධාන මාර්ගය ඡේදනය කරමින් ගිනිකොණ දෙසට වඩදිය රේඛාව ඔස්සේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම හමුවන තෙක් ද,

*බස්නාහිර*

අවසන් වරට සඳහන් ලක්ෂ්‍යයේ සිට වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම ඔස්සේ උතුරු දෙසට වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු හා බස්නාහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වාද එතැන් සිට එකී මායිම ඔස්සේ ඊසාන හා වයඹ දෙසට 2005.11.23 දිනැති 1420/17 දරන *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද අධිවේගී මාර්ගයට අයත් නාගරික සංවර්ධන ප්‍රදේශයේ දකුණු මායිම ඡේදනය වන ලක්ෂ්‍ය දක්වා ද එම ලක්ෂ්‍යයේ සිට උතුරු දෙසට අඳින ලද ලම්භ රේඛාව 2005.11.23 දිනැති අංක 1420/17 දරන *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශයේ උතුරු මායිම දක්වා ද එතැන් සිට වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම ඔස්සේ වයඹ හා බටහිර දෙසට ගාල්ල - මාදම්පේ මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍ය දක්වා ද, එතැන් සිට එකී මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍ය ඡේදනය කරමින් වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම ඔස්සේ උතුරු, ගිනිකොණ හා ඊසාන දෙසට හමුවන ආරම්භක ලක්ෂ්‍ය දක්වා අඳින ලද රේඛාවෙන් ඇතුළත පිහිටි මුළු මහත් ප්‍රදේශය.

EOG 10 - 0171

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.